**ශීර්ෂය 432 - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ප්‍රකාශය කරමි.

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **වියදම් කළමනාකරණය**

------------------------

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,300,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.1,652,041 ක් උපයෝජනය කර නොතිබුණි. | අවශ්‍යතා අඩුවෙන් පැන නැගීම හා කොවිඩ් තත්ත්වය යටතේ වියදම් අඩුවී ඇත. | ලබාදී ඇති පරිදි ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.4,600,000 ක ප්‍රතිපාදනවලින් රු.2,313,989 ක් උපයෝජනය කර නොතිබූ අතර අංක 432-1-2-0-2106 දරන ප්‍රාග්ධන වැය විෂය සඳහා වූ රු.500,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි, වාහන වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් දැරීම සිදුනොවුණි. එමෙන්ම 2020 වර්ෂය තුල පැවති කොවිඩ් 19 රෝගී තත්වය හේතුවෙන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවූ බැවින් එම වැය විෂයන් වල වියදම අඩුවී ඇත. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු. රෙ. 1646 අනුව වාහන භාර නිලධාරීන් විසින් මාසයකට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම 268 (අ) පොදු ආකෘතියේ ලියන ලද මාසික සාරාංශයේ මුල් පිටපතක් සමඟ, දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත්, අමාත්‍යාංශය අයත් වාහන 14 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | දැනට පවතින හෝ පැවති කොවිඩ් 19 තත්වය යටතේ නිලධාරින් කාර්යාල වලට ගෙන්වා ගැනීමට ඇතිවූ අපහසුතාව මත එම රාජකාරි යාවත්කාලීනව සිදුකර ගත නොහැකි වූ බැවින් මේ වන විට ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර අදාල තොරතුරු ලබා දීම සිදුකරනු ඇත. | වාහන ධාවන සටහන් නියමිත පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පරිදි සෑම මාස 06 කට වරක් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ වාහන 26 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | පසුගිය කාලපරිච්ඡේදය තුල පවතින කොවිඩ් තත්වය හේතුවෙන් ඒ සඳහා අවශ්‍ය නිලධාරින් ගෙන්වා ගැනීමේ අපහසුතා මත ඉන්ධන පරීක්ෂා සිදුකර ගත නොහැකි වී ඇත. ඉදිරි දින වලදී එම කටයුතු අවසන් කර තොරතුරු වාර්තා කරනු ඇත. | නියමිත කාලය තුළ වාහනවල ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතුය. |
| (ඇ) | මු. රෙ. 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැන්පතු ලේඛණයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව දක්වමි. | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | මු.රෙ.110 ප්‍රකාරව 2018 අගෝස්තු 17 දිනෙන් පසුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | නව රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා ඇති බැවින් එම පොත්පත්, ලේඛන යාවත්කාලීනව සිදුකිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | මු. රෙ. 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සතිපතා, මාස්පතා, ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඒ ඒ අංශ වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය සමාලෝචනය කර අවස්ථානුකූලව අදාල සැලසුම් සංශෝධනය කරමින් අභ්‍යන්තර පද්ධතිය හා පාලනය විධිමත් කර ඇත. එහිදී ප්‍රගති සමාලෝචන රැස්වීම් වල වාර්තා සකස් කර සියළුම අංශවල නිලධාරීන් වෙත වගකීම් පවරා ඇති බැවින් අඛණ්ඩව අභ්‍යන්තර පාලනය සමාලෝචනය කර ඇත. ඒ සඳහා අවශ්‍ය තහවුරු කිරීම් කාර්යාල ගොනුවල පවතින බැවින් එය විගණන කටයුතු සඳහා ඉදිරිපත් කල හැකි වනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම**

| විගණන නිරීෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ, මු. රෙ. 880 (i) යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත් නිලධාරීන් සංඛ්‍යාව හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් අය කර ඇප තැන්පත් ලේඛනය පවත්වා ගෙන යාමට අදාල කටයුතු කඩිනමින් සිදු කරන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීම කටයුතු කළ යුතුය. |

## 3.2 පාඩු හා හානි

| විගණන නිරිෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා , පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙතින් 2018 ජුනි 13 දින ලැබී තිබුණු KC 5500 මෝටර් රථය 2018 අගෝස්තු 24 දින අනතුරකට පත්ව තිබුණි. මෙම රථය අමාත්‍යාංශය වෙත මෙතෙක් පවරාගෙන නොතිබුණු අතර අනතුරින් රු.6,783,254 ක අලාභයක් සිදු වී තිබුණද එය මෙතෙක් වගකිවයුතු පාර්ශවයෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. මෙම මෝටර් රථය කල් ඉකුත් වූ රක්ෂණ බලපත්‍රයක් සහිතව ධාවනය කර ඇති නිසා අනතුර සිදුවීමෙන් ඇති වූ පාඩුව රක්ෂණ ආයතනය මගින් ද ආවරණය කර ගැනීමට නොහැකිව තිබුණි. | එම අනතුර සිදුවන අවස්ථාවේ එහි රක්ෂණය අවලංගු වී තිබූ බැවින් රක්ෂණ වන්දි ලබාගැනීමට හැකියාවක් නොතිබූ බැවින් අදාළ නිලධාරියාගෙන් එම වන්දිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 66 ක් වූ අතර, එයින් 38 ක් පුරප්පාඩුව පැවතුණි. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් 2020/12/31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතිනි. ඉතා කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |